# විවෘත ලංසු කැඳවීමයි
## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- හම්බන්තොට
## භාණ්ඩ මිල දී ගැනීම

කෘෂිකර්ම,පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරනු ලබන පහත ව්‍යාපෘතීන්ට අදාළව භාණ්ඩ මිල දී ගැනීම සඳහා සුදුසුකම්ලත් සහ අදාළ ක්ෂේත්‍රයේ ලියාපදිංචි ආයතන/සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | ව්‍යාපෘතිය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක ආහාර බෝග වගා වැඩසටහන යටතේ සූර්යබල වතුර පොම්ප පද්ධති මිල දී ගැනීම | සූර්යබල වතුර පොම්ප පද්ධති (01 HP/02 HP/03HP) | 52 |
| 02 | වන සත්ත්ව හානි පාලනය සහ වගා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වායු රයිෆල් මිල දී ගැනීම | වායු රයිෆල් (ලී මිල සහිත) | 320 |

01. **සුදුසුකම්**

අ). ලියාපදිංචි සැපයුම්කරුවකු විය යුතුය

ආ). භාණ්ඩ අලෙවිය හා අලෙවියෙන් පසු සේවාව සම්බන්ධයෙන් පළපුරුද්ද

02. **ලංසු ලේඛන පරික්ෂා කිරීම හා ලබා ගැනීම**

ලංසුව සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2026.08.10 දින සිට 2026.08.24 දක්වා පෙ.ව 9.00 සිට ප.ව 2.00 දක්වා රජයේ වැඩකරන දින හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයට පැමිණ හෝ **www.hambantota.dist.gov.lk** වෙබ් අඩවියට පිවිස ලංසු ලේඛන පරික්ෂා කළ හැකි අතර, **හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ සරප් වෙත ලංසු ලේඛන ගාස්තුව වන රු.4,000.00ක ගෙවීම සිදුකර ලබා ගත් රිසිට්පත සහ සම්පූර්ණ කරන ලද ලංසු අයදුම්පත සමඟ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කිරීමෙන් හෝ Govpay මඟින් ගෙවීම් කර ලබාගත් රිසිට්පත 0707500916 වට්ස්ඇප් අංකයට විද්‍යුත් ලිපිනය සහ ඉහත වෙබ් අඩවියෙන් බාගත කළ ලංසු අයදුම්පත සමග ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් යොමු කිරීමෙන් ලබා ගත හැක.**

03. **පූර්ව ලංසු සාකච්ඡාව** 2026.08.18 වන දින පෙ.ව 10.00 හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන අතර, ලංසුකරුට හෝ ඔහු විසින් බලය පවරන ලද එක් නියෝජිතයකුට සහභාගී විය හැක.

04. **මිල ගණන් යොමු කිරීම හා විවෘත කිරීම**

ලංසු භාරගැනීම අවසන් වන 2026.08.25 වන දින ප.ව 2.00ට අවසන් වන අතර, එදිනට හෝ ඊට ප්‍රථම "**දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට**" යන ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් හෝ කුරියර් සේවා මගින් හෝ අතින් ගෙනවිත් ගිණුම් අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක. ලංසු ලේඛන මුල් පිටපත හා අනු පිටපත ලෙස පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු අතර, ලංසු බහාලන කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි " **(ලංසු අංකය )**" සඳහන් කර තිබීම අනිවාර්ය වේ. 2026.08.25 දින ප.ව 2.15 ට ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුට හෝ බලයලත් නියෝජිතයකුට ඒ සඳහා සහභාගී විය හැක.

වැඩිදුර විස්තර 047-2256139 අංකය ඇමතීමෙන් ලබා ගත හැක.

සභාපති

දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව, හම්බන්තොට